# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/2/2025 (ASC)

රේනක කරුණාරත්න
**අභියාචක**
**එදිරිව**
විගණන සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.04.28**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක පෞද්ගලිකව පෙනී සිටින ලදි
වගඋත්තරකාර විගණන සේවා කොමිෂන් සභාව වෙනුවෙන් නීති නිලධාරිනි පී.එල්.ඒ.එච්.කේ.ලියනාරච්චි මිය.

## -නියෝගය-

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

ආර්.කරුණාරත්න නැමැති අය විසින් 2025.08.05 දිනැතිව ඉදිරිපත් කර ඇති මෙම අභියාචනය මගින් ඉල්ලා ඇත්තේ, ඔහු වෙත පනවා ඇති වැටුප් වර්ධකයක් අඩු කිරීමේ නියෝගයෙන් නිදහස් කර, ඔහුට හිමිවිය යුතුව තිබූ උසස්වීම් ලබා දෙන ලෙසට ය. අභියාචනා පෙත්සම මගින් ඉල්ලා ඇති ඉහත සඳහන් උසස්වීම සඳහා බාධකයක්වී ඇත්තේ, 2025.07.18 දිනැති ලිපිය මගින් විගණන සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ඔහු වෙත පනවන ලද විනය නියෝගයයි. එසේ නම් මෙහිදී සළකා බැලිය යුතු වන්නේ වැටුප් වර්ධකයක් විලම්භනය කරමින් අභියාචක වෙත ලබාදී ඇති නියෝගයේ නිරවද්‍යතාවයයි.

ඉහත කී විනය නියෝගය නිකුත් කර ඇත්තේ, අභියාචක වෙත නිකුත් කර තිබූ 2024.06.11 දිනැති චෝදනා පත්‍රය මගින් නගා තිබූ චෝදනා හතරෙන් පළමු චෝදනාව හැර ඉතිරි චෝදනා තුනට අභියාචක වරදකරු කර තිබීම හේතුවෙනි. ඉහත සඳහන් චෝදනා පත්‍රය මත අභියාචකට එරෙහිව විධිමත්

විනය පරීක්ෂණයක්, නීතිඥ එස්.කේ.ලියනගේ නැමැති පරීක්ෂණ නිලධාරියා විසින් පවත්වා ඇත. ඔහුගේ පරීක්ෂණ වාර්තාව වි.3 ලෙසට සළකුණු කරමින් විගණන සේවා කොමිෂන් සභාව විසින් 2026.01.22 වෙනි දින ඉදිරිපත් කරන ලද වාර්තාව සමග අමුණා ඇත. ඒ අනුව මෙහිදී සළකා බැලිය යුතු වන්නේ අභියාචක වෙත විනය නියෝගයක් පැනවීමට හේතු වු පරීක්ෂණ නිලධාරියාගේ තීරණය නිවැරදිද යන්නයි.

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති කරුණු අතර ඔහු සඳහන් කර ඇත්තේ, විනය පරීක්ෂණය පැවැත්වීමට පෙර පවත්වන ලද මූලික පරීක්ෂණය පැවැත්වීමේ දී ඔහුට සාධාරණයක් ඉටු නොවූ බවයි. ඔහු වැඩිදුරටත් පවසා ඇත්තේ, ඔහු වෙත ලැබීමට නියමිතව තිබූ උසස්වීම වැළැක්වීම අරමුණු කරගෙන, ඔහුට විනය නියෝගයක් පැනවීමට කටයුතු සළස්වා තිබූ බවයි.

කෙසේ වෙතත් මෙහිදී විනය නියෝගය පනවා ඇත්තේ ආයතන සංග්‍රහයේ විධි විධාන අනුව පවත්වන ලද පරීක්ෂණයක ප්‍රතිඵලයක් වශයෙනි. එම විධිමත් විනය පරීක්ෂණය නිවැරදිව සිදුනොවන බවට, ඒ ඒ මුල් අවස්ථාවලදීම හෝ විධිමත් විනය පරීක්ෂණය අතරතුර දී හෝ අභියාචක විසින් කරුණු දක්වා තිබිය යුතුය. එසේ වූයේ නම් එම අවස්ථාවල දී ම, විධිමත් විනය පරීක්ෂණ නිලධාරියා විසින් කරුණු විමසා ඒ සම්බන්ධයෙන් තීරණයක් ගත යුතුය. එම අවස්ථාවන්හී දී එවැන්නක් සිදුවී නොමැත.

තවද, මෙම කරුණ සම්බන්ධයෙන් සාක්ෂිදුන් සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට ද අභියාචකට අවස්ථාව ලැබී ඇත. එබැවින් මේ අවස්ථාවේ දී, එම සාක්ෂි දුන් සියලුම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සම්බන්ධයෙන් සළකා බලා, අභියාචක සම්බන්ධයෙන් ලබා දී ඇති තීරණය වෙනස් කළ යුතුද යන්න සළකා බැලිය යුතුය. කෙසේ වෙතත්, විධිමත් විනය පරීක්ෂණයේ තීරණය අනුව ගනු ලැබූ තීරණයේ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් කරුණු සළකා බැලිය යුතු වනවා ඇත.

විනය නියෝගය පැනවීමට හේතු වූ විධිමත් විනය පරීක්ෂණ තීරණයෙහි නිරවද්‍යතාවය මිළඟට සළකා බලනු ඇත. අභියාචකට එරෙහිව 2024.06.11 දිනැති චෝදනා පත්‍රය ඉදිරිපත් කර ඇත. එහි චෝදනා හතරක් ඇතුළත් වේ. විධිමත් විනය පරීක්ෂණයේ දී පළවන චෝදනාවෙන් අභියාචක නිදහස් කර ඇති අතර, II, III, IV යන චෝදනා සම්බන්ධයෙන් ඔහුව වැරදිකරු බවට පත්කර ඇත. අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ II, III, IV චෝදනා පහත දැක්වේ.

II. ඔබ ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධරයෙකු ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විගණන උප කාර්යාලයේ (JLO/C) විගණන අධිකාරීවරයා ලෙස සේවය කරමින් සිටියදී 2023 නොවැම්බර් 13 දින සිට 2023 නොවැම්බර් 15 දින දක්වා කාලය තුළ වටරැක, අගුණකොළපැලැස්ස, ගාල්ල සහ කෑගල්ල බන්ධනාගාර වල වාරක පරීක්ෂණයක යෙදී සිටියදී 2023 නොැවැම්බර් 15 වැනි දින හෝ ඊට ආසන්න දිනයකදී ගාල්ල බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරී, ලලාන් පුලින මෙන්ඩිස් කරුණාරත්න යන අය හෝ ගාල්ල බන්ධනාගාරයේ සේවය නියුක්ත බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරීන් වෙත ස්වකීය නිල තත්ත්වය භාවිතා කරමින් බලපෑම් කොට මුදල් ගෙවා හෝ නොගෙවා, බන්ධනාගාර පරිශ්‍රය තුලදී පරා මාළු කුරියෙකු ලබා ගැනීම තුළින් 2017 ඔක්තෝම්බර් 02 දින නිකුත් කළ අංක විලේ/2017/24 දරණ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහයේ 7.10 වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම මගින් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ජේදයේ රාජ්‍ය නිලධරයන් සම්බන්ධයෙන් සිදු කළ හැකි වැරදි සම්බන්ධ පළමු උපලේඛනයේ 15 වැනි වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීම.

III. ඔබ ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධරයෙකු ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විගණන උප කාර්යාලයේ (JLO/C) විගණන අධිකාරීවරයා ලෙස සේවය කරමින් සිටියදී 2023 ජුනි මස 12 වැනි දින සිට හෝ ඊට ආසන්න දින දෙකකදී අනුරාධපුර බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරී ලෙස එම අවස්ථාව වන විට සේවය කරමින් සිටි සට්ටම්බිගේ මොහාන් කරුණාරත්න යන අය දුරකථනයෙන් අමතා, අනුරාධපුර බන්ධනාගාරයේ සේවය නියුක්ත බන්ධනාගාර සැරයන්වරයෙක් වන කේ.කේ.කේ.ටී.අරවින්ද යන අය ස්ථාන මාරු කරන ලෙස බන්ධනාගාර අධිකාරීවරයාට බලපෑම් කිරීම මගින් 2017 ඔක්තෝම්බර් 02 දින නිකුත් කළ අංක විලේ/2017/24 දරණ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහයේ 7.8 වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම මගින් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ජේදයේ රාජ්‍ය නිලධරයන් සම්බන්ධයෙන් සිදු කළ හැකි

වැරදි සම්බන්ධ පළමු උපලේඛනයේ 13 සහ 15 වැනි වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීම.

IV. ඔබ ඉහත I සිට III දක්වා චෝදනා වල සඳහන් වැරදි එකක් හෝ කිහිපයක් හෝ සියල්ල සිදු කිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් සම්බන්ධයෙන් සිදු කළ හැකි වැරදි සම්බන්ධ පළමු උපලේඛනයේ 10 වැනි වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.

දෙවන චෝදනාව සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් කර ඇති අයවළුන් අතරින් ප්‍රධාන සාක්ෂිකරු වන්නේ, එල්.පී.එම්.කරුණාරත්න යන නිලධාරියාය. ඔහු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, 2023 ජුනි මස සිට ඔහු ගාල්ල බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරී වශයෙන් සේවය කළ බවත්, අභියාචක 2023.11.14 වෙනි දින දුරකථනයෙන් ඔහුව අමතා, පසුදින ගාල්ල බන්ධනාගාරයට ඔහු පැමිණෙන බවත්, එසේ පැමිණ ආපසු යන අවස්ථාවේ දි ඔහුට රැගෙන යාම සඳහා පරා මාළු කුරියෙක් සූදානම් කර තබන ලෙසට දැනුම් දුන් බවත් ය. අභියාචක විසින් පහත සඳහන් හරස් ප්‍රශ්න ඉහත කී සාක්ෂිකරුගෙන් අසා ඇත.

(1) "**ප්‍රඃ මා මාළු සඳහා මුදල් රුවන් බුද්ධික මහතාට ලබා නොදුන් බව ඔබ කියන්නේ කෙසේද?**

**(2) ප්‍රඃ 2023.11.15 දින සිට 2023.11.06 දක්වා කාල පරිච්ඡේදය තුළ මම මාළු සම්බන්ධව කවර හෝ චෝදනාවක් ඔබ වෙත එල්ල කළාද?**

**පිඃ මට එවැනි චෝදනාවක් එල්ල කළේ නෑ. නමුත් මාළුවා හොඳද යන්න එම කාලය තුළදී චූදිත නිලධාරියාගෙන් දුරකථනයෙන් මා විමසා සිටියා.**

**(3) ප්‍රඃ එම ප්‍රශ්නයට මා දුන් පිළිතුර කුමක් ද ?**

**පිඃ ඔහු ප්‍රකාශ කළා මාළුවා රස බව.**"

අභියාචක විසින් අසන ලද ප්‍රශ්න වලින් හැඟී යන්නේ, ඔහු විසින් ලබා ගත් මාළු සඳහා ඔහු විසින් මුදල් ගෙවූ බවයි. එයින් පෙනී යන්නේ අභියාචක විසින්, ඔහුගේ විගණනට යටත් වූ කාර්යාලයක ප්‍රධාන නිලධාරියා ලවා අභියාචකගේ ප්‍රයෝජනය සඳහා කිසියම් පාරිභෝගික භාණ්ඩයක් ලබා ගෙන ඇති බවයි.

තවද, ඉහත කී සාක්ෂිකරුගේ සාක්ෂිය බිඳ හෙළීමේ අරමුණින් අභියාචක විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත දේශන වලටද අපගේ අවධානය යොමු විය. අභියාචක විසින් එහි සඳහන් කර ඇත්තේ, පුලින කරුණාරත්න සහ රුවන් බුද්ධික යන අය විසින් මාළු මිලදී ගැනීමට අභියාචකව පොළඹවන අන්දමින් කටයුතු කර, ඔහුගේ ඉල්ලීමකින් තොරව හා ඔවුන්ගේ ස්ව කැමැත්ත මත මාළු මිලදී ගත් බවයි. එකී දේශන වල ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ මිලදී ගෙන තිබූ මාළු වලට, ඔහු විසින් මුදල් ගෙවූ බව සහ එම මාළු කුරියා ඔහු විසින් රැගෙන ගිය බවයි. (ඒ සඳහා බලන්න 2026.02.21 දිනැතිව ඉදිරිපත්කර ඇති ලිඛිත දේශන වල 14 වන පිටුවේ 1 වන ඡේදයේ අවසාන පේලි තුන)

ඉහත කරුණු අනුව ස්ථිරව තීරණය කළ හැක්කේ, අභියාචක විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු ලෙස කටයුතු කරමින්, විගණනයට යටත් වන කාර්යාලයක සේවයේ නියුතු අංශ ප්‍රධානියෙකු සම්බන්ධ කර ගනිමින්, හා ඔහුගේ උදව් ලබා ගනිමින්, අභියාචකගේ ප්‍රයෝජනය පිණිස කිසියම් පාරිභෝගික ද්‍රව්‍යයක් ලබා ගෙන ඇති බවයි.

එය එසේ නම්, විගණන නිලධාරියෙකු ලෙස එවැනි ක්‍රියාවක් කිරීම විනයානුකූලව දඩුවම් කළ යුතු කරුණක් වන්නේද, යන්න පිළිබඳව අවධානය යොමු කරන ලදී.

විගණන සේවා කොමිෂන් සභාව විසින් 2026.01.21 දින ඉදිරිපත් කරන ලද වාර්තාවේ 10 (ඈ) ඡේදයේ සඳහන් කර ඇත්තේ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා නිකුත් කර ඇති වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයේ 7.8 වගන්තියේ සඳහන් පරිදි අභියාචක විසින් කරන ලද ක්‍රියාව, වෘත්තීය ආචාර ධර්ම වලට පටහැනි බවයි. එය පහත දැක්වේ.

7.8 “**විගණිත ආයතනය සතු මානව, මූල්‍ය සහ භෞතික සම්පත් පරිහරණය අවිධිමත් ලෙස අත්පත් කර ගැනීම සහ මෙහෙයවීම නොකළ යුතු අතර. ආයතනයේ කළමනාකරණමය කටයුතු වලට විගණන කාර්ය මණ්ඩලය සම්බන්ධ නොවිය යුතුය.**”

තවද එකී දේශනයන්හි වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයේ 7.10 වගන්තියේ දක්වා ඇති පරිදි ද, අභියාචකගේ ක්‍රියා කලාපය වෘත්තීය ආචාර ධර්ම වලට අනුකූල නොවන බවයි. එම වගන්තිය පහත දැක්වේ.

7.10 “**විගණන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් විසින් තමන්ට පෞද්ගලික වන සේ මූල්‍ය හා මූල්‍ය නොවන වාසි සහ වරප්‍රසාද විගණිත ආයතනයෙන් ලබා ගැනීමට කටයුතු නොකළ යුතුය.**”

යනුවෙනි.

ඉහතින් විස්තර කර ඇති පරිදි විධිමත් විනය පරීක්ෂණයේ දී පැහැදිලිව සනාථ වී ඇත්තේ, අභියාචක විසින් ඔහුගේ පරිභෝජනය සඳහා මාළු ලබාගැනීමේ දී ඔහුගේ විගණනයට යත් වූ කාර්යාලයේ ප්‍රධාන තනතුර ලත් නිලධාරියෙකු ලවා කටයුතු කර තිබීමයි. එයින් පෙනී යන්නේ, ඉහත කී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා වූ වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයේ සඳහන් ආචාර ධර්ම අභියාචක විසින් කඩකර ඇති බවයි. ඒ අනුව දෙවන චෝදනාව සඳහා අභියාචක වරදකරු කිරීමේ දෝෂයක් පෙනෙන්නට නැත.

අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති තුන්වන චෝදනාව වන්නේ, අනුරාධපුර බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරී ලෙස සේවය කරමින් සිට මොහාන් කරුණාරත්න යන අයට, අභියාචක විසින් දුරකථනයෙන් අමතා, අනුරාධපුර බන්ධනාගාරයේ නියුතු සැරයන් කේ.කේ.කේ.ටී.අරවින්ද යන අය ස්ථානමාරු කරන ලෙසට අභියාචක විසින් බලපෑම් කරන ලද බවයි.

ඉහත කී මොහාන් කරුණාරත්න යන අය විධිමත් විනය පරීක්ෂණයේදී සාක්ෂි ඉදිරිපත් කර ඇත. මෙහිදී ද, අභියාචක විසින් මෙම සාක්ෂිකරුගෙන් අසා ඇති ප්‍රශ්න වලින් පැහැදිලි වන්නේ, ඔහුගේ විගණනයට යටත්වූ සේවා ස්ථානයක සේවය කරන නිලධාරියෙකු සම්බන්ධයෙන් විශේෂයෙන්ම මාරුවීම් සම්බන්ධයෙන් අභියාචක විසින් වැඩි අවධානයකින් යුක්තව කටයුතු කර ඇති බවයි. එම ප්‍රශ්න පහත දැක්වේ. (පරීක්ෂණ නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති 2025.02.18 දිනැති වාර්තාවේ 11 වන පිටුව)

(1) “ප්‍ර: **කේ.කේ.ටී.වි අරවින්ද නැමැත් සැරයන්වරයා 1998 සිට මේ දක්වා දීර්ඝ කාලයක් අනුරාධපුර බන්ධනාගාරයේ සේවය කරනවා නේද?**

**(2) ප්‍ර: 2019 වර්ෂයේ දී කේ.කේ.ටී.වී.අරවින්දට මාරුවීමක් ලැබුණා ද එය අවලංගු කරගත් බව ඔබ දන්නවාද?**

**(3) ප්‍ර: 2017 මොහු ස්ථාන මාරුවීමක් හංගිලිපොළට ලබා ගත්තාද? 2018 දී නැවත අනුරාධපුර බන්ධනාගාරයටම සේවයට පැමිණි බව ඔබ දන්නවාද?**”

කිසියම් සේවා ස්ථානයක සේවය කරන නිලධාරියෙකුගේ ස්ථාන මාරුවක් සම්බන්ධයෙන් බලපෑම් කිරීමට, විගණන නිලධාරියෙකු ලෙස අභියාචකට

හැකියාවක් ලැබෙන්නේ නැත. ඉහත කී මොහාන් කරුණාරත්න යන සාක්ෂිකරු විසින් සඳහන් කර ඇත්තේ, අරවින්ද යන නිලධාරියාගේ ක්‍රියා කලාපයන් සම්බන්ධයෙන් අභියාචක විසින් විශේෂ අවධානයකින් යුක්තව කටයුතු කර ඇති බවයි. ඒ බව පැහැදිලි වශයෙන්ම ඉදිරිපත් ව ඇති සාක්ෂි වලින් තහවුරු වේ. (පරීක්ෂණ නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති 2025.02.18 දිනැති වාර්තාවේ පිටුව 10)

> ***"නමුත් එළියේ තිබෙන ආපන ශාලාව ගැන විශේෂයෙන් බලන්න කිව්වා. ඒකෙන් එක මිනිහෙක් හම්බ කරගෙන කනවා කියලා කිව්වා. ඒත් එක්කම ඔතන ඉන්න ජේලරුත් මහ හොරෙක් කියලා කිව්වා. කැන්ටිම කරන්නේ අරවින්ද කියලා නිලධාරියෙක්, එයා ඒකෙන් අයුතු ලෙස හම්බකරනවා. මම මේ මගේ විගණන විමසුම් වල පැහැදිලිව සඳහන් කර තිබෙනවා කියලා කිව්වා" (පිටුව 34 හා 35)***

> ***"මෙම සිදුවීමෙන් මාසයකට පමණ පසුව නැවත වතාවක් බන්ධනාගාර මූලස්ථානයේ පොදු අංකයෙන් මාගේ ජංගම දුරකථනයට ඇමතුමක් ලබාගත් කරුණාරත්න මහතා "ඔයා අරවින්ද ට කැන්ටිමට යන්න එපා කියලා තිබුණාට අරවින්ද තවමත් කැන්ටිමට යන බව මට තොරතුරු ලැබිලා තිබෙන බව කිව්වා." (පිටුව 35)***

> ***"එවිට කරුණාරත්න මහතා මට යලි ප්‍රකාශ කළේ, නැහැ එහෙම කරන්න අවශ්‍ය නැහැනේ ඔයාට පුළුවන්නේ ඔය මනුස්සයාව OPC ගබඩාවෙන් අයින් කරලා වෙන තැනක ඩියුටි දාන්න කියලා මට පැවසුවා" (පිටුව 35)***

ඉහත සඳහන් සාක්ෂි වලින් පැහැදිලිව පෙනී යන්නේ අභියාචක විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධයෙන් වන වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයේ 7.8 සහ 7.10 වගන්ති කඩකරමින් කටයුතු කර ඇති බවයි.

ඉහත කරුණු සළකා බැලීමේ දී පෙනී යන්නේ අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ II, III චෝදනා වලට ඔහු වරදකරු කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් වී ඇති බවයි.

IV චෝදනාව පදනම් වි ඇත්තේ අනික් චෝදනා සම්බන්ධයෙන් වන තීරණයන් මතය. ඒ අනුව II, III චෝදනා වලට ඔහුව වරදකරු බවට පත්කර තිබීම හේතුවෙන්, IV චෝදනාවටද ඔහුව වරදකරු කර තිබීමේ දෝෂයක් නැත.

ඉහත කරුණු සළකා බලා, විධිමත් විනය පරීක්ෂණයෙන් පසුව අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබු II, III, IV චෝදනා සම්බන්ධයෙන් ඔහුව වරදකරු බවට පත් කිරීමේ දෝෂයක් පෙනෙන්නට නැත. එබැවින් ඒ මත ක්‍රියා කරමින් පනවා ඇති දඩුවම් කෙරෙහි මැදිහත් වීමටද මෙම විනිශ්චය අධිකාරය කැමැත්තක් දක්වන්නේ නැත. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුත්තේ, විශේෂයෙන්ම රජයේ විගණන කටයුතු වල නිරතව සිටින අභියාචකට ලබා දී ඇති දඩුවම වන එක් වැටුප් වර්ධකයක් විලම්භනය කිරීම, ඉදිරිපත් කර තිබූ චෝදනා දෙස බැලීමේ දී, ඉතා ලිහිල් දඩුවමක් ලෙස හැඳින්වීම වරදක් නොවන බවයි.

ඉහත කරුණු සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-